


**මෙම සමාගමේ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල සහ කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපොල රත්මලාන පවතින පහත සඳහන් තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

# කාර්මික ශිල්පි (විදුලි) II වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය** : අධික්ෂණ නිළධාරීන්ගේ උපදෙස් පරිදි කාර්යක්ෂමව හා අඛණ්ඩව සමස්ථ විදුලි බල සැපයුම නිසි පරිදි ක්‍රියාත්මක කිරීම, බෙදා හැරීම, නඩත්තු කිරීම හා සියළුම විදුලි උපකරණ, යන්ත්‍ර හා ගොඩනැගිලි වල විදුලි පද්ධති සැකසීම හා නඩත්තු කිරීම.

**රැකියාවේ වගකීම්** :

(I) මැනීමේ සහ පරීක්ෂා කිරීමේ උපකරණ විධිමත්ව භාවිතා කිරීම හා ඒවායේ ආරක්ෂාව තහවුරු කිරීම.

(II) විදුලි උපකරණ, මෙවලම් භාවිතය හා ඒවායේ ක්‍රියාකාරීත්වය සහ නඩත්තුව පිළිබඳව මනා අවබෝධයක් ලබා තිබීම.

(III) විදුලි කාර්මිකයන්ගේ ලොග් සටහන් පොත් දිනපතා සම්පූර්ණ කිරීම.

(IV) ගොඩනැගිලිවල විදුලි පරිපථ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය නඩත්තු කටයුතු කිරීම.

(V) විදුලි කාර්මික වැඩවල නිරතවීමේදී පුද්ගලයින්ට හා උපකරණවලට සිදුවන අනතුරු වළක්වා ගැනීම සඳහා අනිවාර්යෙන්ම ආරක්ෂිත විධිවිධාන අනුගමනය කිරීම.

(VI) විදුලි අර්බුද අවස්ථාවලදී ගුවන් තොටුපොලේ ක්‍රියාකාරීත්වය පවත්වා ගෙන යාම සඳහා සක්‍රිය ලෙස දායක වීම.

(VII) විටින් විට සිදු කල යුතු පරීක්ෂා කිරීම් සැලැස්මට අනුව සිදු කිරීම.

**සුදුසුකම්** :

(අ) ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන් / ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් නිකුත් කරනු ලැබූ විදුලි ක්ෂේත්‍රයේ දෑවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලා සහතිකයක් හෝ දෑවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීමෙන් අනතුරුව කාර්මික විද්‍යාලයක් මගින් නිකුත් කරනු ලැබූ වෘත්තිය සහතිකයක් විදුලි ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**හෝ**

ජාතික වෘත්තිය සුදුසුකම් 4 වන මට්ටමේ (NVQ Level 4) වෘත්තිය සහතිකයක් විදුලි ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**සහ**

(ආ) ආධුනිකත්ව කාලසීමාවද/ පාඨමාලා කාල සීමාවද/ පුහුණු කාල සීමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

| | | |
|---|---|---|
| **වයස** | : | අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 35ට නොවැඩි විය යුතුය. |
| **වැටුප** | : | තෝරාගනු ලබන්නන් හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ. |
| **බඳවා ගැනිමේ ක්‍රමය** | : | ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින් |

**පොදු කරුණු :-**

මෙම තනතුරු සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සමාගමට අයත් දිවයිනේ පිහිටි ඕනෑම සේවා ස්ථානයක අවශ්‍ය වූ විට සේවය කල යුතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පතක් **"සභාපති, ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල, කටුනායක" යන ලිපිනයට 2025 මාර්තු මස 04 වන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ වම් කෙළවරේ **කාර්මික ශිල්පී (විදුලි) 11 වන ශ්‍රේණිය** ලෙස සඳහන් කළ යුතුවේ.

**තෝරා ගැනිමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම් ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.**

**පාඨමාලා සහතික, සේවා සහතික සහ අදාළ සහතිකවල ඡායා පිටපත් සමග ඉදිරිපත් නොකරන අයදුම්පත් සහ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

---

**සභාපති**
**ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**

**Advertised on 23/02/2025**